(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 321.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2013 දෙසැම්බර් මස 05 වැනි බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2208/'11

1.

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) සංවර්ධන ලොතරැයි මණ්ඩලයට අදාළව, පසුගිය වර්ෂ පහක කාලය තුළ එක් එක් වර්ෂයේදී,

(i) යෙදවූ මුළු ප්‍රාග්ධනය හා සංචිත ප්‍රමාණය කොපමණද;

(ii) ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

(iii) කාර්ය මණ්ඩලයේ මුළු සේවක සංඛ්‍යාව, එක් සේවකයෙකු වෙනුවෙන් දැරූ පිරිවැය සහ එක් සේවකයෙකුගෙන් ලැබූ ලාභය කවරේද;

(iv) රජය වෙත ගෙවන ලද අධ්‍ය කිරීම් හෝ බදු ප්‍රමාණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ කවර හෝ මුදලක් කපා හරිනු ලැබුවේද;

(ii) එසේ නම්, එසේ කපා හරින ලද මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ කරන ලද්දේ කවර හේතුවක් නිසාද;

(iv) එය සිදු කළ දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පසුගිය වර්ෂ පහක කාලය තුළ එම මුදල් භාවිතා කරන ලද ආකාරයට වඩා කාර්යක්ෂම ලෙස සංවර්ධන ලොතරැයි මණ්ඩලයට එම මුදල් පරිහරණය කළ හැකිව තිබුණේද;

(ii) එසේ නම්, එය කළ හැකි ආකාරය කවරේද;

(iii) එසේ කළ නොහැකි නම්, එයට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2224/'12

2.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ, "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, කුරුණෑගල, අනුරාධපුර, මහනුවර යන දිස්ත්‍රික්කවල විදේශ රැකියාවල යෙදෙන්නන් වෙනුවෙන්ම නිවාස 15000කින් සමන්විත නව නිවාස යෝජනා ක්‍රම තුනක් ආරම්භ කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස ව්‍යාපෘති ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වන විට ඉදිකිරීම් අවසන් කර ඇති ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(iii) එම නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති නගර කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් ව්‍යාපෘතිවල පදිංචි කර ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2439/'12

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, නිල්වලා නිම්නය දෙපස පිහිටා ඇති කිරල කැලේ ප්‍රදේශයේ කුඹුරු විශාල ප්‍රමාණයක් පුරන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ඉඩම් වී වගා කිරීමට හෝ වෙනත් බෝග වර්ග වගා කිරීම සඳහා සුදුසු පරිදි සකස් කිරීමට සැලසුම් කර තිබේද;

(ii) එසේ නම්, එම සැලසුම කවරේද;

(iii) මේ වන විට එම බිම් අස්වැද්දීමට අදාළ කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iv) එසේ නම්, වෙන් කර ඇති මුළු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3365/'12

4.

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු මැද පළාතේ රජයේ පාසල්වල මේ වන විට සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) උගන්වන විෂයය අනුව එම ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) උක්ත පළාතේ පාසල්වල විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා සංගීතය යන විෂයයන්ට හා ප්‍රාථමික අංශයේ ඉගැන්වීම් සඳහා පවතින ගුරු හිඟය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පාසල්වල ගුරු අතිරික්තයක් පවතින විෂයයන් හා එම එක් එක් විෂයයට අදාළව පවතින අතිරික්තය කවරේද;

(v) එම අතිරික්ත ගුරුවරුන් බඳවාගත් පදනම කවරේද;

(vi) අතිරික්ත ගුරුවරුන් අතර සිටින උපාධිධාරීන් සංඛ්‍යාව හා ස්වේච්ඡා පදනම යටතේ බඳවා ගත් ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උතුරු මැද පළාතේ අත්‍යාවශ්‍ය විෂයයන් සඳහා පවතින ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) එමගින් පළාතේ ගුරු අවශ්‍යතාව සපුරා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3628/'13

5\.

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇඹිලිපිටියේ කඩදාසි කම්හල මුද්‍රා තැබීමට හේතුව කවරේද;

(ii) එම කම්හල මුද්‍රා තැබූ ආයතනය කුමක්ද;

(iii) 2011 නොවැම්බර් 15 වැනි දින සිට 2012 වර්ෂය අවසානය දක්වා එම කඩදාසි කම්හලේ නිෂ්පාදන ධාරිතාවය සහ ආදායම් තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඇඹිලිපිටිය කඩදාසි කම්හල සතුව පැවති යන්ත්‍රසූත්‍ර යකඩවලට විකුණා ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3655/'13

6\.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ ඇති, ශිෂ්‍ය සංඛ්‍යාව 30ට අඩු පාසල් කවරේද;

(ii) එම එක් එක් පාසලේ සේවය කරන ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත පාසල් වැඩි දියුණුකර සිසුන් සංඛ්‍යාව වැඩි කර ගැනීමට හෝ මෙම පාසල් එම තත්ත්වයෙන්ම තවදුරටත් පවත්වාගෙන යාම සුදුසුද යන්න පිළිබඳව අධ්‍යයනය කර තිබේද;

(ii) එසේ නම්, ඒ අනුව වැඩි දියුණු කරන ලද පාසල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශිෂ්‍ය සංඛ්‍යාව අඩුවීමේ හේතුව මත පසුගිය වර්ෂ 5 තුළ අම්පාර දිස්ත්‍රික්කයේ වසා දමන ලද පාසල් කවරේද;

(ii) එම සිසුන් සඳහා වෙනත් පාසල් ලබා දීමට කටයුතු කර තිබේද;

(iii) වසා දමන ලද එම පාසල් ගොඩනැගිලිවල වත්මන් තත්ත්වය කවරේද;

(iv) එම ගොඩනැගිලි වෙනත් කාර්යයන් සඳහා යොදාගෙන තිබේද;

(v) එසේ නම්, එම කටයුතු කවරේද;

(vi) නොඑසේ නම්, මෙම ගොඩනැගිලි පාවිච්චියට නොගෙන වල් බිහිවීමට ඉඩහැර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3694/'13

7\.

ගරු අනුර දිසානායක මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) රාජ්‍ය දැව සංස්ථාව මගින් 2013.03.06 වැනි දින රිවිර පුවත්පතේ දැන්වීමක් පළ කළේද;

(ii) එම දැන්වීම පළ කිරීමේ අරමුණ කුමක්ද;

(iii) එම දැන්වීම වෙනුවෙන් රාජ්‍ය දැව සංස්ථාව විසින් වැය කරන ලද මුදල කොපමණද;

(iv) එම මුදල් කවර වැය ශීර්ෂය යටතේ වැය කළේද;

(v) යම් දේශපාලන පක්ෂයක, යම් තනතුරක් සඳහා යම් පුද්ගලයෙකු පත්වූ විට, ඊට අදාළව රාජ්‍ය දැව සංස්ථාවට දැන්වීම් පළ කළ හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2653/'12

8.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන් වන පරිදි කාන්තාවන් සඳහා වූ විශේෂ කාර්යාලයීය බස් රථ සේවාවක් ආරම්භ කර තිබේද;

(ii) එවැනි බස් රථ සේවාවක් ආරම්භ කර තිබේ නම්, ඊට අදාළ විස්තර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2702/'12

9.

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පිරිවෙන්වල අධ්‍යාපනය ලබන භික්ෂුන්වහන්සේලා දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ සිය අධ්‍යාපන කටයුතු කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ වන විට පිරිවෙන්වල අධ්‍යාපනය ලබන ගිහි හෝ පැවිදි එක් ශිෂ්‍යයෙකු සඳහා වාර්ෂිකව ලබා දෙන ආධාර මුදල කොපමණද;

(ii) එම මුදල වර්තමාන ආර්ථික තත්ත්වය හා සැසඳීමේදී ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iii) එම මුදල වැඩි කිරීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, වැඩි කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2787/'12

10.

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කරන ලද දිනය කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සමාව දීම කොන්දේසි සහිත සමාව දීමක්ද; නැතහොත් කොන්දේසි විරහිත සමාව දීමක්ද යන්නත්;

(ii) ෆොන්සේකා මහතාගේ විශ්‍රාමික අයිතිවාසිකම් සහ හමුදා නිලය නැවත ලබා දෙන ලද්දේද යන්නත්;

(iii) තවමත් එතුමාව "ජෙනරාල්" යන පදවි නාමයෙන් හැඳින්විය හැකිද යන්නත්;

(iv) ෆොන්සේකා මහතාට එරෙහිව උසාවියේ තවත් පොරොත්තු නඩු තිබේද යන්නත්;

(v) ජනාධිපති සමාව නිසා විභාගවීමට නියමිත එම නඩු අහෝසි වන්නේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සරත් ෆොන්සේකා මහතා සමග කටයුතු කිරීම හෝ එතුමාට සහාය දීම නිසා පීඩාවට හෙළන ලද හෝ සේවය අවසන් කිරීමට ලක්වූ පොලිසියේ හෝ හමුදාවේ හටයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම හෝ වන්දි ලබා දීම සිදුකර තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කිරීමේ කරුණට අදාළව,

(i) ඒ පිළිබඳව සාකච්ඡා පැවැත්වූ පුද්ගලයින් කවුරුන්ද යන්නත්;

(ii) ඒ සම්බන්ධයෙන් බලපෑම් ඇති කළ රටවල් සහ එය සිදු වූයේ කවර අවස්ථාවක ද යන්නත්;

(iii) දේශපාලන සහ ආගමික නායකයින්ගේ මැදිහත්වීම් නොසලකා හැරියේ කවුරුන්ද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

ගරු එම්. බී. ෆාරුක් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය,— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"ශ්‍රී ලංකා ප්‍රභා ලේඛක සමිති සම්මේලනය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2014) — (එකොළොස්වැනි වෙන් කළ දිනය) — කාරක සභාව (දෙසැම්බර් 04 වැනි දින ප්‍රගතිය)

*2.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 ඔක්තෝබර් 19 දිනැති අංක 1780/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*3.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59 වැනි වගන්තිය සමග කියවිය යුතු, 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 දෙසැම්බර් 14 දිනැති අංක 1788/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*4.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 3),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 29 වැනි වගන්තිය සමග කියවිය යුතු, 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 ජූලි 27 දිනැති අංක 1768/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*5.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 4),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 8 වැනි වගන්තියේ (ඇ) ඡේදය සමග කියවිය යුතු, 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 සැප්තැම්බර් 07 දිනැති අංක 1774/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*6.

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා,— ධීවර හා ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 5),— 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 8 වැනි වගන්තියේ (ඇ) ඡේදය සමග කියවිය යුතු, 61 වැනි වගන්තිය යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 අගෝස්තු 10 දිනැති අංක 1770/25 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*7.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*8.

ශ්‍රී ලංකා ප්‍රතිපත්ති අධ්‍යයන ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

15.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

18.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

19.

මෛත්‍රීපාල සේනානායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

20.

හැන්ඩ්ස් ෆෝ එඩියුකේෂන් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

විසර්ජන පනත් කෙටුම්පත (2014) නමැති පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---